# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,461—1939ක්වූ ජූනි මස 30 වෙනි දිනවූ සිකුරාදා.

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### උපාඞ්ග නීති.

“ වසූනාගමන් පිළිබඳ ආඥාපණත ”යයි නම්ලත් ආඥාපණතේ අංක 2 දරන වගන්තියේ ප්‍රකාර 1939යේ ජූලි මාසේ තලවිල සන්තාන දේවස්ථානයේ මංගල්‍යය සම්බන්ධව ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේට එම වගන්තියෙන් ලැබී තිබෙන බලය ප්‍රකාර පනවනලද නියෝගයයි.

ඩී. බී. ජයතිලක,
අභ්‍යන්තර කාර්‍ය්‍ය භාරකාර මන්ත්‍රීතුමා.

වශී 1939ක්වූ ජූනි මස 12වෙනි දින අභ්‍යන්තර කාර්‍ය්‍ය භාරකාර මන්ත්‍රීතුමාගේ කන්තෝරුවේදීය.

#### ව්‍යවස්ථා.

1. මෙම ව්‍යවස්ථාවල “ලැගුම්භූමි” යන්නෙන් හඟවන්නේ මිට යාකර තිබෙන උප ලේඛනයෙහි සඳහන්වන සීමාතුළ පිහිටි භූමිභාගයි “උප දිසාපතිතුමා” යන්නෙන් හඟවන්නේ පුත්තලම හලාවත දෙපළාතේ උප දිසාපතිතුමාය.

2. උප දිසාපතිතුමාගේ විශෙෂ හෝ සාමාන්‍ය ආඥාවකින් ලැගුම්භූමිය තුළ ලැගුම්ගැනීම තහනම්කරනලද කිසිම ස්ථානයක කිසිවකු විසින් ලැගුම් ගතයුතු නොවේ.

3. ශරීරකෘත්‍ය සඳහා උප දිසාපතිතුමා විසින් හෝ ඔහුගේ අනුමතය ඇතුව වෙන්කර තිබෙන ස්ථානවල හැර ලැගුම්භූමිය තුළ අන්කිසි තැනක කිසිවකු විසින් මලමූත්‍ර නොකළ යුතුයි.

4. උප දිසාපතිතුමා විසින් හෝ ඔහුගේ අනුමතය ඇතුව ඒ සඳහා වෙන්කර තිබෙන ස්ථානවල හෝ භාජනවල මිස ලැගුම්භූමියේ වෙන තැනක කිසිවකු විසින් කුණුකසල රොඩු ආදිය හෝ කුණු වතුර නොදැමිය යුතුයි.

5. (a) මැරීම පිණිස ලැගුම්භූමියට ගෙනෙනලද ගවයන් හා උප දිසාපතිතුමාගේ විශෙෂ හෝ සාමාන්‍ය ආඥාවකින් එබඳු භූමියෙහි තබාගැනීමට අවසර දෙනලද ගවයන් හැර අන්කිසි ගවයකු ලැගුම්භූමියෙහි තබානොගත යුතුයි.

(b) උප දිසාපතිතුමා විසින් ගවගාලක් වශයෙන් විශෙෂයෙන් නියමකරනලද තැනක හෝ ඒ කටයුත්තට යෙදීම පිණිස ඔහු විසින් අනුමතකරනලද තැනක හැර ලැගුම්භූමියට සමීපව වෙන තැනක ගවයින් නොතැබිය යුතුයි.

(c) ගවයින් භාරව සිටින අය උන්ගේ ගොම ඒට නියමකර තිබෙන අසල ස්ථානයකට ඉවත්කරවා තමාගේ ගවයන් ඉන්නාතැන සැමවිටම පවිත්‍රකර තබාගත යුතුයි.

6. ආහාර පිණිස සාදා ලැගුම්භූමිය තුළ විකුණනුලබන සියලුම කෑම ජාති (a) පිරිසිදු කබඩ්සිවල නොහොත් රෙදිවල දවටා හෝ ඉන් වසා හෝ, (b) වසනලද වීදුරු පෙට්ටිවල දමා හෝ (c) ලැගුම්භූමිය භාර සනීපාරක්ෂක නිලධාරීතුමා විසින් හෝ වෛද්‍ය නිලධාරීතුමා විසින් මැනවයි පිළිගන්නාලද වෙනත් පියන් සහිත භාජනවල දමා හෝ මැස්සන්ගෙන් හා දූවිල්ලෙන් ආරක්ෂාකළ යුතුයි.

7. බෝවෙන රෝගයකින් පෙළෙන කෙනකුට හෝ ලැගුම්භූමියේ පවිත්‍රකමට බාධාවක්ව සිටියහැකි කෙනකුට ලැගුම්භූමියට ඇතුල්වන්නට ඉඩනොදිය යුතුයි.

8. මංගල්‍යය කාලය තුළදී ලැගුම්භූමියෙහි යම් වසංගත රෝගයක් හටගැණුනිනම් වසූනාකාරයසින්ට වසූනා භූමියෙන් පිටවී යන්නටද, පිටවී යන මාර්ග සහ ඔවුන් ගෙනයන ක්‍රම නියමකරන්නටද උප දිසාපතිතුමාට පුළුවන.

9. (a) ලැගුම්භූමිය තුළ බෝවෙන හෝ පැතිරෙන රෝගයකින් පෙළෙන සෑම අයද, (b) ඔහු එසේ පෙළෙන බව දැන දැනම ඔහු සමග වාසයකරන සෑම අයද ඒ රෝගියා ගැන ලැගුම්භූමිය භාරව සිටින සනීපාරක්ෂක නිලධාරීතුමාට හෝ වෛද්‍ය නිලධාරීතැනට දැනුම්දෙන්නට ඕනෑය.

10. ලැගුම්භූමිය තුළ යම් වැවක් හෝ ළිඳක් යම් නියම කටයුත්තක් සඳහා වෙන්කොට ඒ බවට ඒ ස්ථානයෙහි දැන්වීමක් ගසා තිබෙනවිට එම වැව හෝ ළිඳ එය වෙන්කොට තබා තිබෙන කටයුත්ත සඳහා හැර අන්කිසි දෙයකට කිසිවකු විසින් නොයෙදිය යුතුයි.

11. පාන්ගෙයක්, සිසිල්බීම සාදන ස්ථානයක්, තේ සහ කෝපි කඩයක්, භෝජනශාලාවක් හෝ ශාලක් තැබීම පිණිස උප දිසාපතිතුමාගෙන් කලින් බලපත්‍රයක් ලබානොගෙන කිසිවකු විසින් ලැගුම්භූමිය තුළ එබඳු ස්ථානයක් තබාගතයුතු නොවේ. බලපත්‍රය නොමිලයේ දෙනුලැබේ.

12. උප දිසාපතිතුමාගෙන් කලින් අවසර ලබානොගෙන කිසිවකු විසින් ලැගුම්භූමියේ මහ වීදියෙන් හෝ වෙනයම් වීදියකින් අසුවනසේ යම් කඩයක් තැනීම හෝ වෙනයම් ගොඩනැගිල්ලක් දික්කිරීම යුතුනොවේ.

13. උප දිසාපතිතුමාගෙන් කලින් අවසර ලබානොගෙන කිසිවකු විසින් ලැගුම්භූමිය තුළ හෝ එහි මායිම්වල සිට හැනැප්මක් ඇතුළත හෝ ගිනිකෙළි හෝ තුවක්කු පත්තු නොකළ යුතුයි.

14. උප දිසාපතිතුමා විසින් හෝ ඔහුගේ අනුමතය ඇතුව ඒ සඳහා නියමකර තිබෙන ස්ථානයක හැර ලැගුම් භූමිය තුළ කිසිවකු විසින් සතුන් නොමැරිය යුතුයි. තවද එබඳු ස්ථානයෙහි සතුන් මරන සෑම අයම එය පවිත්‍රව තබා ගැණීම ගැන වගකිය යුතුවේ.

### උප ලේඛනය.

#### තලවිල ලැගුම්භූමියේ සීමා.

උතුරට තලවිලම්බෙයි; දකුණට ඒතාලේ තලවිල සහ තේලා කුඩාතලවිල පාරවල්වල එරුඹුකුඩල් හණ්ඩියේ සිට කොළින් බස්නාහිර අතට මුහුදට යන පාර; නැගෙනහිරට පාණ්ඩාරම් කරුක්කුවච්චම් පෙරියතොප්පිටම් පාරවල්; බස්නාහිරට මුහුද.

#### ඒතාලේ ලැගුම්භූමියේ සීමා.

උතුරට තෙලිකුඩාවේ සිට වැලිකන්ද දක්වා බස්නාහිරට යන පාර; නැගෙනහිරට කලපුව; දකුනට සුරුම්ඇල; බස්නාහිරට වැලිකන්ද.

---

## ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම්.

### ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

#### නිරවුල්කිරීමේ දැන්වීම නො. 2,062 (කළුතර).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවන ඉඩම් වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය මේ 1939ක්වූ ජූනි මස 30වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මා වෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම් රජයන්තක ඉඩම්යයි ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජයන්තක ඉඩම් වශයෙන් ගෙණ ඒව කටයුතුකරණ බවද එකී ආඥාපණතේ 4වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

මේ 1939ක්වූ ජූනි මස 9වෙනි දින කළුතර කච්චේරියේදීය.

පී. ජේ. හඩ්සන්,
කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප දිසාපතිතුමා.

(a) මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කළුතර ආණ්ඩුවේ උප දිසාපතිතුමාගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(b) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකටවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම් වලට අයිතිකම්කීම හැටියට භාරගනු ලැබේ.

### උප ලේඛනය.

බස්නාහිර දිසාවේ කළුතර දිස්ත්‍රික්කයේ රයිගම්කෝරළේ උඩුගහපත්තුවේ බටුගම්පොල යන ගම පිහිටා තිබෙන මෙහි පහත සඳහන් මායිම්වලට මැදිවූ පහත දක්වන සියලුම බිම් කට්ටි, එනම්:—

#### පලමුවෙනි කොටස. මුල් සිතියමේ නො. A 589.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 16 | කිරිගල්මූකලාන .. | .. 0 3 4 |

මායිම්—උතුරට කෝම්පෙ ගම්මායිම (අඳුදෙල); නැගෙනහිරට සහ දකුණට ගම්සභාපාර; බස්නාහිරට හදපාන්ගොඩ ගම්මායිම.

#### දෙවෙනි කොටස. මුල් සිතියමේ නො. A 589.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 17 | කිරිගල්මූකලාන .. | .. 1 0 22 |

මායිම්—උතුරට කෝම්පෙ ගම්මායිම (අඳුදෙල); නැගෙනහිරට කෝම්පෙ ගම්මායිම (අඳුදෙල) සහ නො. 46,199 දරණ පිඹුර; දකුණට නො. 295,336 දරණ පිඹුර; බස්නාහිරට ගම්සභාපාර.

---

### ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

#### නිරවුල්කිරීමේ දැන්වීම නො. 2,063 (කළුතර).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවන ඉඩම් වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය මේ 1939ක්වූ ජූනි මස 30වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරණ මා වෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම් රජයන්තක ඉඩම්යයි ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජයන්තක ඉඩම් වශයෙන් ගෙන ඒව කටයුතුකරන බවද එකී ආඥාපණතේ 4වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

මේ 1939ක්වූ ජූනි මස 9වෙනි දින කළුතර කච්චේරියේදීය.

පී. ජේ. හඩ්සන්,
කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප දිසාපතිතුමා.

(a) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු කළුතර ආණ්ඩුවේ උප දිසාපතිතුමාගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(b) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකටවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම් වලට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

### උප ලේඛනය.

බස්නාහිර දිසාවේ කළුතර දිස්ත්‍රික්කයේ රයිගම්කෝරළේ උඩුගහපත්තුවේ කෝම්පෙ යන ගම පිහිටා තිබෙන මෙහි පහත සඳහන් සියළුම බිම්කට්ටි, එනම්:—

#### 1වෙනි කොටස. මුල්සිතියමේ නො. A 589.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 1 | කිරිගල්මූකලාන (ප්‍රසිද්ධපාර සඳහා වෙන් කරනලද කොටස) .. | .. 1 1 13 |
| 2 | කිරිගල්මූකලාන .. | .. 9 0 23 |
| 3 | එම .. | .. 21 1 31 |
| 4 | කිරිගල්වත්ත .. | .. 0 1 18 |
| 4 | එම .. | .. 0 1 15 |
| 6 | එම .. | .. 0 0 19 |
| 7 | එම (ප්‍රසිද්ධපාර සඳහා වෙන්කරනලද කොටස) | 0 0 9 |

මායිම් මෙසේය—උතුරට කුඹුරු අස්වැද්දීම පිණිස වතුර ගැනීමට කැදූලද ඇල සහ ඇල්පහන්දෙල; නැගෙනහිරට නො. 75,519 දරන පිඹුර, නො. 8,976 දරන මුල් සිතියමේ නො. 7,584ඊ කට්ටිය (බී. ජේම්ස්අප්පු සහ තවත් අය විසින් අයිතිවාසිකම් කියාසිටින දෙරකඩකුඹුර), නො. 75,519 දරන පිඹුර, නො. A 430 දරණ මුල් සිතියමේ නො. 4ඊ කට්ටිය, නො. 75,520 දරන පිඹුර, කෝම්පෙ දෙල සහ ඉන්ගිරියේ ගම්මායිම; දකුණට ඉන්ගිරියේ ගම්මායිම සහ පාදුක්කේ සිට ඉන්ගිරිය දක්වා තිබෙන ප්‍රසිද්ධ පාර; බස්නාහිරට පාදුක්කේ සිට ඉන්ගිරිය දක්වා තිබෙන ප්‍රසිද්ධ පාර.

#### 2වෙනි කොටස. මුල් සිතියමේ නො. A 589.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 8 | කිරිගල්වත්ත .. | .. 1 0 7 |
| 9 | කිරිගල්මූකලාන (ප්‍රසිද්ධ පාර සඳහා වෙන්කර නලද කොටස) .. | .. 0 2 9 |
| 10 | කිරිගල්මූකලාන .. | .. 11 0 33 |

මායිම් මෙසේය—උතුරට සහ නැගෙනහිරට පාදුක්කේ සිට ඉන්ගිරිය දක්වා තිබෙන ප්‍රසිද්ධ පාර; දකුණට ඉන්ගිරියේ සහ බටුගම්පොල ගම්මායිම් (අඳුදෙල); බස්නාහිරට ගම්සභාපාර

#### 3වෙනි කොටස. මුල් සිතියමේ නො. 589.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 11 | කිරිගල්මූකලාන .. | .. 2 1 27 |
| 12 | එම (ප්‍රසිද්ධ පාර සඳහා වෙන්කරනලද කොටස) | 0 0 29 |
| 14 | කිරිගල්මූකලාන .. | .. 11 2 19 |

මායිම් මෙසේය—උතුරට පාදුක්කේ සිට ඉන්ගිරිය දක්වා තිබෙන ප්‍රසිද්ධ පාර; නැගෙනහිරට ගම්සභාපාර; දකුණට බටුගම්පොල සහ හදපාන්ගොඩ ගම්මායිම් (අඳුදෙල); බස්නාහිරට හදපාන්ගොඩ ගම්මායිම (නො. 143,191 දරන පිඹුර සහ නො. A 589 දරණ මුල් සිතියමේ නො. 15වෙනි කට්ටිය) සහ නො. A 589 දරණ මුල් සිතියමේ නො. 13වෙනි කට්ටිය.

---

### ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

#### නිරවුල්කිරීමේ දැන්වීම නො. 2,064 (කෑගල්ල).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවන ඉඩම් වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය මේ 1939ක්වූ ජූනි මස 30වෙනි දින පටන් තුන් මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මා වෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම් රජයන්තක ඉඩම්කැයි ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය

යටතේ ප්‍රකාශකරනු ලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙණ ඒට කටයුතුකරණ බවද එකී ආඥාපණතේ 4 වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1939ක්වූ මැයි මස 15වෙනි දින කෑගල්ලේ කච්චේරියේදීය.

ආර්. අර්විනාගේ,
කෑගල්ලේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

(a) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු කෑගල්ලේ ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒමාගේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(b) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකටවත් උරිත්යන යම් පාරකව අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

උප ලේඛනය.

සබරගමු දිසාවේ කෑගල්ල පලාතේ ගල්බොඩකෝරලේ තනිප්පේරුපත්තුවේ ඉරුක්ගොඩ යන ගමේ පිහිටා තිබෙන බිම්කට්ටි, එනම් :—

මූල් සිතියමේ නො. A 16.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 1 | කහගලේසියඹලාගස්තැන්නේහේන .. | 4 0 20 |
| 2 | මියනකොලඹ .. .. | 0 0 31 |
| | | 4 1 11 |

මිට මායිම්—උතුරට පී. පී. 238,406 පිට වනරතන තෙරුන්නාන්සේ අයිතිකියන කබල්කොස්ගහමූලවත්ත; නැගෙනහිරට බී. සේපාලා අයිතිකියන කබල්කොස්ගහමූලහේන, පී. පියරතන උන්නාන්සේ අයිතිකියන කුරුණකොහොතැන්නේහේන සහ ඉලුක්ගොඩ විහාරයේ බාරකාරයෝ අයිතිකියන කැන්නේහේන; දකුනට බී. ජී. උක්කුබංඩා සහ තවත් අය අයිතිකියන මියනකොලඹහේන; බස්නාහිරට බී. ජී. උක්කුබන්ඩා සහ තවත් අය අයිතිකියන මියනකොලඹ, පී. පියරතන උන්නාන්සේ අයිතිකියන වවුලන්නේහේන, ජේ. අප්පුහාමි අයිතිකියන වවුලන්නේහේන සහ බී. බංඩිහා සහ තවත් අය අයිතිකියන හේනයායගේහේන.

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

පළාත් පාලනය සම්බන්ධ කාරක මන්ත්‍රණ සභාවේ සම්මතය ඇතුව, වර්ෂ 1934ක්වූ ජූනි මස 22වෙනි දින ගැසට් පත්‍රයේ පළකරනලද ආණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ නියමය පරිදි, ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 5වෙනි වගන්තියේ ප්‍රකාර (පරිච්ඡේද 203—1938 ප්‍රකාශිතමත් ලංකාවේ මන්ත්‍රණ සභාසම්මත නියෝග, 5වෙනි කොටස) අනුව මෙහි පහත දක්වන ඉඩම් ප්‍රසිද්ධ කටයුත්තක් සඳහා :—එනම් මරදාන පාර පලල්කිරීමට උවමනා බැවින් ඒ ඉඩම් යුතු ප්‍රකාර අයිතිකරගැනීමට අණලබනලදී. ඒ ඉඩම්නම් :—

විභාගකිරීම වර්ෂ 1939ක්වූ ජූලි මස 24වෙනි දින පෙරවරු 11ට.

ප්‍රාරම්භ පලූන නො. A 942. මරදාන දකුණු කොට්ඨාසය.

| ඉඩම් කට්ටිය. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියාසිටින අයගේ නම. | විශාලකම, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | (බින්ස්පාරේ) වරිපනම් නො. 1 (මරදාන පාරේ) වරිපනම් නො. 512, 514 සහ 516, හා (මරදාන පාරේ) වරිපනම් නො. 3, 7 සහ 11 දරණ ඉඩම්වල කොටස් | ගලෙන්බැඳි උළුසෙවිලිකල ගොඩනැගිලිවල කොටස්, ගලෙන් බැඳිස්තෝප්පුවක් සහ ගලෙන් බැඳි බිත්තියක කොටසක් | ඔබ්බලපිටියේ ඇන්ඩර්සන් පාරේ පදිංචි ඒ. ආර්. ඇම්. සලීම් | 0 0 6·44 |
| 2 | (මරදාන පාරේ) වරිපනම් නො. 520 දරණ ඉඩමේ කොටසක් | ගලෙන්බැඳි උළුසෙවිලිකල ගොඩනැගිලිවල කොටස්, සිමෙන්ති බිමක කොටසක්, ගලෙන් බැඳි ස්තෝප්පුවක්, ගලෙන්බැඳි බිත්තියක් සහ ගලෙන් බැඳි බිත්තියක කොටසක් | කැටවලමුල්ලේ පදිංචි වී. සී. පෙරේරා | 0 0 3·06 |
| 3 | (මරදාන පාරේ) වරිපනම් 522 දරණ ඉඩමේ කොටසක් | ගලෙන්බැඳි උළුසෙවිලිකල සොල්දර ගොඩනැගිල්ලක ස්තෝප්පුවක්, සාලයක්, සිමෙන්ති බිමක කොටසක් සහ ගලෙන්කල බිත්තියක කොටසක් ඇති ඉඩමක් | පිටකොටුවේ (4) හතරවෙනි හරස් වීදියේ පදිංචි ඇස්. ඇස්. ඇම්. මුහුප්ලේ | 0 0 2·47 |
| 4 | (මරදාන පාරේ) වරිපනම් නො. 524 සහ 526 දරන ඉඩම්වල කොටස් | ගලෙන්බැඳි උළුසෙවිලිකල සොල්දර ගොඩනැගිලිවල ස්තෝප්පුවක්, කාණු ජලනලයක්, සිමෙන්ති බිමක කොටසක්, සින්කහඹු මඩුවක් සහ ගලෙන් බැඳි බිත්තියක කොටසක් ඇති ඉඩම | කොළඹ බාර්න්ස් ප්ලේස්හි පදිංචි ඩබ්ලිව්. ඒ. ඩී. ඇම්. සී. ජයවර්ධන | 0 0 3·92 |

විභාගකිරීම වර්ෂ 1939ක්වූ ජූලි මස 25වෙනි දින පෙරවරු 11ට.

| ඉඩම් කට්ටිය. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියාසිටින අයගේ නම. | විශාලකම, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 6 | (මරදාන පාරේ) වරිපනම් නො. 528, 528/1, 530, 532, 534, 528/2 528/3 සහ 528/4 දරණ ඉඩම් සහ (මරදාන පාරේ) වරිපනම් නො. 528/8 සහ G 528 දරන ඉඩම්වල කොටසක් | ගලෙන්බැඳි උළුසෙවිලිකල ගොඩනැගිලි, ගලෙන්බැඳි කාණුවක කොටසක්, ගලෙන්බැඳි බිත්තියක කොටසක් සහ මිදුලක හා ස්තෝප්පුවක කොටසක් ඇති ඉඩම | මරදානේ දෙවෙනි කොට්ඨාසයේ පදිංචි ජෝන් තෙන්නකෝන් | 0 0 8·15 |
| 7 | (මරදාන පාරේ) වරිපනම් නො. 536, 538, 540, 538/1, 538/15 සහ 538/14 දරන ඉඩම් සහ (මරදාන පාරේ) වරිපනම් නො. 538/2, 538/12 සහ G 538 දරන ඉඩම්වල කොටස් | ගලෙන්බැඳි උළුසෙවිලිකල ගොඩනැගිලි, ගලෙන්බැඳි කාණුවක කොටසක්, ස්තෝප්පු, සාලෙක කොටසක් සහ ගල් බිත්ති ඇති ඉඩම | පිටකොටුවේ මහවීදියේ (වෙස් වර්න් ඩිපාට් ස්ටෝර්ස්)හි පදිංචි ඇම්. ඇල්. ඇම්. මකීම් | 0 0 7·26 |
| 8 | (මරදාන පාරේ) වරිපනම් නො. 544, 546, 548 සහ 544/15 දරන ඉඩම් හා (මරදාන පාරේ) වරිපනම් නො. G 544, 544/14 සහ 544/1 දරන ඉඩම්වල කොටස් | ගලෙන්බැඳි උළුසෙවිලිකල ගොඩනැගිලි, සිමෙන්ති බිමක්, කාණු ජලනලයක්, ස්තෝප්පුවක්, සිමෙන්ති බිමක කොටසක් සහ ගල්බිත්තියක හා ස්තෝප්පුවක කොටස් ඇති ඉඩම | බේරුවල සහ මරදානේ පදිංචි යූ. ඇල්. ඒ. ඇල්. මරික්කාර් | 0 0 6·28 |

| ඉඩම් කට්ටිය. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියාසිටින අයගේ නම. | විශාලකම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 9 | (මරදාන පාරේ) වරිපනම් නො. 550 දරන ඉඩමේ කොටසක් | ගලෙන්බැඳි උළුසෙවිලිකල ගොඩනැගිල්ලක කොටසක් සහ ගල්බිත්තිවල කොටස් හා ස්තෝප්පුවක්ද තිබේ | පිටකොටුවේ (වෙස්ටර්න් ඩෙුපර්ස්ටෝර්ස්) හි පදිංචි ඒ. ඇල්. ඇම්. සලීම් | 0 | 0 | 1·57 |
| 10 | එම .. | ගලෙන්බැඳි උළුසෙවිලිකල ගොඩනැගිල්ලක කොටසක්, ගල්බිත්තිවල කොටස් සහ සිමෙන්ති බිමක කොටසක්ද තිබේ | එම .. | 0 | 0 | 0·34 |

විභාගකිරීම වන් 1939ක්වූ ජූලි මස 26වෙනි දින පෙරවරු 11ට.

| ඉඩම් කට්ටිය. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියාසිටින අයගේ නම. | අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 11 | (මරදාන පාරේ) වරිපනම් නො. 552 දරන ඉඩමේ කොටසක් | ගලෙනබැඳි උළුසෙවිලිකල ගොඩනැගිල්ලක කොටසක් සහ ගල්බිත්ති සහ ස්තෝප්පුවක්ද තිබේ | මරදානේ පදිංචි නෝර්මන් මිර්ලෝප් | 0 | 0 | 1·67 |
| 12 | එම .. | ගලෙන්බැඳි උළුසෙවිලිකල ගොඩනැගිල්ලක කොටසක්, ගල්බිත්තිවල කොටස් සහ සිමෙන්ති බිමක කොටසක්ද තිබේ | එම .. | 0 | 0 | 0·50 |
| 13 | (මරදාන පාරේ) වරිපනම් නො. 554 දරන ඉඩමේ කොටසක් | ගලෙන්බැඳි උළුසෙවිලිකල ගොඩනැගිල්ලක කොටසක්, ගල්බිත්තිවල කොටස් සහ ස්තෝප්පුවක්ද තිබේ | පිටකොටුවේ මහවීදියේ පදිංචි ඇම්. ඇල්. ඒ. කුද්දුස් | 0 | 0 | 2·52 |
| 14 | (මරදාන පාරේ) වරිපනම් නො. 556, G 556, 558 සහ 560 දරන ඉඩම්වල කොටස් | ගලෙන්බැඳි උළුසෙවිලිකල ගොඩනැගිලිවල කොටස්, සින්නහඩු මඩුවක කොටසක්, ස්තෝප්පුවක කොටසක්, ගල්බිත්ති හා ස්තෝප්පුවල කොටස් ඇති ඉඩම | මරදානේ දෙවෙනි කොටසේ නො. 560 පදිංචි ජ්‍ෆ්‍රේරන්ස් ද සිල්වා | 0 | 0 | 9·12 |

විභාගකිරීම වන් 1939ක්වූ ජූලි මස 27වෙනි දින පෙරවරු 11ට.

| ඉඩම් කට්ටිය. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියාසිටින අයගේ නම. | අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 16 | (මරදාන පාරේ) වරිපනම් නො. 562 සහ (ඇවන් ඩේල් පාරේ) නො. 125 දරන ඉඩම | ගලෙන්බැඳි උළුසෙවිලිකල ගොඩනැගිලි, ගල්බිත්තිවල සහ ස්තෝප්පුවක කොටස්ද තිබේ | මරදානේ දෙවෙනි කොටසේ නො. 562 පදිංචි අයි. බී. ඇම්. ජෝන් ද සිල්වා | 0 | 0 | 2·75 |
| 17 | (ඇවන්ඩේල් පාරේ) වරිපනම් නො. 121 සහ (ඇවන්ඩේල් පාරේ) වරිපනම් නො. 115 දරන ඉඩමේ කොටසක් | ගලෙන්බැඳි උළුසෙවිලිකල ගොඩනැගිල්ලක් ගල්බිත්තිවල සහ ස්තෝප්පුවක කොටස්ද තිබේ | දෙමටගොඩ පදිංචි සමරත්උම්මා | 0 | 0 | 2·72 |
| 18 | (ඇවන්ඩේල් පාරේ) වරිපනම් නො. 115 දරන ඉඩමේ කොටසක් | ගලෙන්බැඳි උළුසෙවිලිකල ගොඩනැගිල්ලක්, ගල්බිත්තිවල හා ස්තෝප්පුවක කොටස්ද තිබේ | එම .. | 0 | 0 | 1·85 |

ඒනිසා 6වෙනි වගන්තියේ නියමවූ ප්‍රකාර ඉහත කී ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව් මෙයින් ප්‍රකාශ කරමි. තවද එකී ඉඩම් ගැන සැලකිමක් ඇති සියලුදෙනාම ඔවුන්ගේ අයිතිවාසිකමේ අනුමද, ඒ වෙනුවට ඉල්ලාසිටින වටිනාකමද, ඒව අයිති ඔප්පුද, එකී ඉඩම් ගැන වටිනාකම ලැබීමට තිබෙන යුතුකම්ද පෙන්වා සිටින පිණිස තමන්ම හෝ තමන් වෙනුවට ක්‍රියාකරන අය හෝ ඉහත සඳහන් දිනවල ඉහත සඳහන් වේලාවට කොළඹ නාගරීක සහා කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණෙන්ට ඕනෑය.

වන් 1939ක්වූ ජූනි මස 28වෙනි දින කොළඹ නාගරීක සහා කන්තෝරුවේදීය.

ඇස්. සී. වික්‍රමසිංහ,
නාගරීක කොමසාරිස්තුමා.

---

වන් 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3වන් ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කාවශ්‍යත්තකට, ඒනම්:—මැරිගෝල්ඩ්-මතුරට දිස්ත්‍රික් රෝඩ් කොමිටි පාරට මෙකී පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරන පිණිස "වන් 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති ආණ්ඩුවේ කරනියෙන පාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

පිහියමේ නො. A 572. ගම—වැවතැන්න සහ වැටගෙපොත.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | වැවතැන්නේහේන .. | ගෙසින් කොටසක් සහිත වත්ත | වලේගෙදර උක්කුරාල, එම අප්පු, එම ඩිංගිරි අම්මා | 0 | 0 | 1·5 |
| 2 | වැවතැන්න .. | වත්ත .. | මතුරට පදිංචි වක්කුඹුරේගෙදර සාමෙල් අප්පුහාමි .. | 0 | 0 | 0·2 |
| 3 | එම .. | එම .. | මතුරට පදිංචි මොහමඩ් සලේමාන් .. .. | 0 | 0 | 0·4 |
| 4 | වැවතැන්නහේන .. | හේන .. | මතුරට පදිංචි රාජකරුණ මේනෙහාවිට්ටි අප්පුහාමිල්ලගෙ දේනා පුංචිහාමිගේ | 0 | 0 | 0·6 |
| 5 | සමර ගොඩනැගිල්ලක කොටසක් | ගොඩනැගිල්ල .. | මතුරට පදිංචි ඇතුල්ගම්ගෙදර උක්කුබන්ඩා රත්නායක | 0 | 0 | 2·1 |
| 6 | එම .. | එම .. | එම .. .. .. | 0 | 0 | 0·7 |
| 7 | වැවතැන්නේහේන .. | හේන .. | මතුරට පදිංචි උඩවැවතැන්නේ අනෝහාමි .. | 0 | 0 | 2·5 |
| 8 | නික්කහුතැන්නේහේන .. | එම .. | මතුරට පදිංචි මුහම්දු මාදින් නූර් සාහිබු .. | 0 | 0 | 4·2 |
| 9 | හපුගහමුලතැන්න .. | හිස්ඉඩම .. | මතුරට පදිංචි අගලකුඹුරේගෙදර බන්ඩා .. | 0 | 0 | 2·6 |
| 10 | එම .. | එම .. | එම .. .. .. | 0 | 0 | 2 |
| 11 | එම .. | එම .. | මතුරට පදිංචි උඩවැවතැන්නෙ අනෝහාමි .. | 0 | 0 | 1·3 |
| 12 | ඉඹක්වත්ත .. | හේන .. | මතුරට පදිංචි රටම්බෙගෙදර රන්බන්ඩා .. | 0 | 0 | 3·4 |
| 13 | තඹඅරුව .. | එම .. | මතුරට පදිංචි ගන්ආචාරීගෙදර කිරිහාමි සහ ඩබ්ලිව්. කේ. සගෝරිස් අප්පුහාමි | 0 | 0 | 2·2 |
| 14 | එම .. | එම .. | මතුරට පදිංචි උඩවැවතැන්නේ අනෝහාමි .. | 0 | 0 | 1·9 |
| 15 | හපුගහමුලතැන්න .. | හිස්ඉඩම .. | එම .. .. .. | 0 | 0 | 3·2 |
| 16 | එම .. | එම .. | මතුරට පදිංචි අගලකුඹුරේගෙදර බන්ඩා .. | 0 | 0 | 9·9 |
| 17 | තඹඅරුව .. | පරන වත්තක කොටසක් | මතුරට පදිංචි උඩවැවතැන්නේ අනෝහාමි .. | 0 | 0 | 1 |
| 18 | එම .. | හේන .. | ගමආචාරීගෙදර කිරිහාමි සහ ඩබ්ලිව්. කේ. සගෝරිස් අප්පුහාමි | 0 | 0 | 4·4 |
| 19 | එම .. | එම .. | එම .. .. .. | 0 | 0 | 9·4 |
| 20 | එම .. | පරන වත්තක කොටසක් | මතුරට පදිංචි උඩවැවතැන්නේ අනෝහාමි .. | 0 | 0 | 1·7 |
| 21 | එම .. | හේන .. | ගමආචාරීගෙදර කිරිහාමි සහ ඩබ්ලිව්. කේ. සගෝරිස් අප්පුහාමි | 0 | 0 | 0·6 |
| | | | | 0 | 1 | 15·8 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1939ක්වූ ජූලි මස 26වෙනි දින උදේ එකොළහට මතුරට ආණ්ඩුවේ බංගලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අයුරෙන් අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑව සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටිනා මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1939ක්වූ ජූනි මස 26වෙනි දින
නුවරඑළියේ කච්චේරියේදීය.

ජී. ඇල්. වීරසිංහ,
ආණ්ඩුවේ උප ඒජන්තතුමා වෙනුවට.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හයවෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කාවශ්‍යත්‍යකට, එනම් :—තංගල්ල-හම්බන්තොට පාරේ සහ තංගල්ල-වීරකැටිය පාරේ හන්දිය දියුණුකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංචාත්භූමිල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම් :—

අතුරු සිතියමේ නො. 10. අවසාන ගම් සිතියමේ නො. 315. ගම—මැඩිල්ල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 107 | පලුගහවත්ත (වරිපනම් නො. 841 කොටසක්) | අවුරුදු 50ක් වයස ඇති පොල්ගස් 2ක්ද, අවුරුදු 8ක් වයස ඇති පුවක්ගස් 1ක්ද, අවුරුදු 12ක් වයස ඇති දෙඹගස් 1ක් සහ දෙහිගස් 1ක්ද, මැටි බිත්ති සහිත ගෙයකින් කොටසක්ද ඇති වත්ත | මැඩිල්ලේ පදිංචි ජුවානා හෙන්නැදිගේ ගබ්‍රියෙල් නෝනා | 0 0 5·1 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 1වෙනි දින අපරභාග 2.30 පැයට තංගල්ලේ තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අයුරෙන් අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑව සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටිනා මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1939ක්වූ ජූනි මස 20වෙනි දින
හම්බන්තොට කච්චේරියේදීය.

ඩබ්ලිව්. හොලම්ස්,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්ගය.

---

## ඉඩම් සශ්‍රීකකිරීමේ දැන්වීම.

### අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි.

(මධ්‍යම පළාතේ ලාංඡකිකයන් සම්බන්ධයෙනි.)

මෙහි පහත විස්තර දැක්වෙන ඉඩම් සඳහාවූ ඉල්ලුම්පත්‍ර කල්පනාවට ගනු පිණිසත් කොටස් වශයෙන් ඒ ඉඩම්වලට අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරගැනීම පිණිසත් තංගල්ලේ තානායමේදී වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 7වෙනි සඳුදා පූ. භා. 9ට 1935ගේ අංක 19 දරණ ඉඩම් සශ්‍රීකකිරීමේ ආඥාපණත යටතේ ඉඩම් කච්චේරියක් හම්බන්තොට ආණ්ඩුවේ අතිරේක උප ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. මේ ඉඩම්කච්චේරි මධ්‍යම පළාතේ ලාංඡකිකයන්ට පමණකි.

3. සියලුම ඉල්ලුම්පත්‍ර ආණ්ඩුවේ උප ඒජන්තතුමා වෙත හම්බන්තොට කච්චේරියට වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 1වෙනි දින හෝ ඊට මත්තෙන් ලැබියයුතුයි.

4. ඉල්ලුම්කරුවන් විසින් ඉල්ලුම්කර තිබෙන ප්‍රමාණයේ හැටියට අක්කරයට රු. 3 බැගින් වැටෙනහ මුදලක් සියලුම ඉල්ලුම්පත්‍රත් සමග එවිය යුතුයි. ඉල්ලුම්කරුගේ ක්‍රියාවක් හෝ ප්‍රමාදයක් නිසා වුවමනා නැති අමතර මැනීමක් කිරීමට ආණ්ඩුවට සිදුවුවහොත් මේ මුදල ආපසු දෙනු නොලැබේ. එබඳු ඒ මුදලක් ඒ ඒ විශෙෂ අවස්ථාවලදී ආපසුදීම හෝ නොදීම යුක්තිසහගතදැයි යන්න ගැන ඉඩම් කොමසාරිස්තුමන් විසින් කරන තීරණය අවසාන තීරණය වන්නේය.

5. සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි. ඉල්ලුම්කරු, නියෝජිත යන දෙදෙනාගෙන් එක්කෙනෙකුවත් ඉඩම් කච්චේරියට නොපැමිණියොත් ඉල්ලුම්කරු තම ඉල්ලීම සම්බන්ධයෙන් තව දුරටත් ක්‍රියාකිරීමට අකැමැති බැව් ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් සලකනු ලැබේ.

6. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

7. සියලුම ඉඩම් ඉල්ලීම් කච්චේරියෙන් ලබාගතහැකිවූ පෝරම්පත්‍රයේ ලියාඑවිය යුතුයි.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් කොමසාරිස්තුමා.

### දීමට යන ඉඩම්වල විස්තර.

F. V. P. 321. ගම—රූකම.

| කැබෙල්ල. | ප්‍රමාණය (කිට්ටු වශයෙන්), අ. රූ. ප. | මේ ඉඩම්වල වැවීමට සුදුසු ශාක වර්ග. |
|---|---|---|
| 141 | .. 47 2 6 .. | පොල්, කජු ආදිය |
| 72 | .. 45 1 13 .. | එම |

F. V. P. 325. ගම—නගදමෝදර.

| කැබෙල්ල. | ප්‍රමාණය (කිට්ටු වශයෙන්), අ. රූ. ප. | මේ ඉඩම්වල වැවීමට සුදුසු ශාක වර්ග. |
|---|---|---|
| 1AA | .. 202 2 3 .. | පැඟිරි, අඹ, කජු, පලතුරු ආදිය |

F. V. P. 324. ගම—කහඳදුව.

| කැබෙල්ල. | ප්‍රමාණය (කිට්ටු වශයෙන්), අ. රූ. ප. | මේ ඉඩම්වල වැවීමට සුදුසු ශාක වර්ග. |
|---|---|---|
| 1V (කොටසක්) | 64 0 0 .. | පැඟිරි, අඹ, කජු පලතුරු ආදිය |
| 1 (කොටසක්) | 239 0 0 .. | එම |

---

### අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි.

(මධ්‍යම පළාතේ ලාංඡකිකයන් සම්බන්ධයෙනි.)

මෙහි පහත විස්තර දැක්වෙන ඉඩම් සඳහාවූ ඉල්ලුම්පත්‍ර කල්පනාවට ගනු පිණිසත් කොටස් වශයෙන් ඒ ඉඩම්වලට අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරගැනීම පිණිසත් කිරම තානායම් බංගලාවේදී වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 7වෙනි සඳුදා අ. භා. 3ට 1935ගේ අංක 19 දරණ ඉඩම් සශ්‍රීකකිරීමේ ආඥාපණත යටතේ ඉඩම් කච්චේරියක් හම්බන්තොට ආණ්ඩුවේ අතිරේක උප ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. මේ ඉඩම් කච්චේරි මධ්‍යම පළාතේ ලාංඡකිකයන්ට පමණකි.

3. සියලුම ඉල්ලුම්පත්‍ර ආණ්ඩුවේ උප ඒජන්තතුමා වෙත හම්බන්තොට කච්චේරියට වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 1වෙනි දින හෝ ඊට මත්තෙන් ලැබිය යුතුයි.

4. ඉල්ලුම්කරුවන් විසින් ඉල්ලුම්කර තිබෙන ප්‍රමාණයේ හැටියට අක්කරයට රු. 3 බැගින් වැටෙනහ මුදලක් සියලුම ඉල්ලුම්පත්‍රත් සමග එවිය යුතුයි. ඉල්ලුම්කරුගේ ක්‍රියාවක් හෝ ප්‍රමාදයක් නිසා වුවමනා නැති අමතර මැනීමක් කිරීමට ආණ්ඩුවට සිදුවුවහොත් මේ මුදල ආපසු දෙනු නොලැබේ. එබඳු ඒ මුදලක් ඒ ඒ විශෙෂ අවස්ථාවලදී ආපසුදීම හෝ නොදීම යුක්තිසහගතදැයි යන්න ගැන ඉඩම් කොමසාරිස්තුමන් විසින් කරන තීරණය අවසාන තීරණය වන්නේය.

5. සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනී සිටීමට නියෝජිතයෙකු එවිය යුතුයි. ඉල්ලුම්කරු, නියෝජිත යන දෙදෙනාගෙන් එක්කෙනෙකුවත් ඉඩම් කච්චේරියට නොපැමිණියොත් ඉල්ලුම්කරු තම ඉල්ලීම සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියාකිරීමට අකැමති බැව් ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් සලකනු ලැබේ.

6. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

7. සියලුම ඉඩම් ඉල්ලීම් කච්චේරියෙන් ලබාගත හැකිවූ පෝරම්පත්‍රයේ ලියාඑවිය යුතුයි.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් කොමසාරිස්තුමා.

දීමට යන ඉඩම්වල විස්තර.

F. V. P. 72. ගම—කැබැල්ලකැටිය.

| කැබැල්ල. | ප්‍රමාණය (කිට්ටු වශයෙන්), අ. රූ. ප. | මේ ඉඩම්වල වැවීමට සුදුසු ශස්‍ය වර්ග. |
| --- | --- | --- |
| 30H | .. 7 1 28 .. | පුවක්, කුරුඳු සහ පලතුරු ආදිය |
| 30L | .. 75 0 0 .. | එම |
| 30 (කොටසක්) | .. 62 0 20 .. | එම |

F. V. P. 153. ගම—පිහලැල්ල.

| | | |
| --- | --- | --- |
| 40 (කොටසක්) | .. 30 0 0 .. | පැඟිරි ආදිය |
| 27 | .. 6 1 14 .. | එම |

F. V. P. 220. ගම—පාහගම.

| | | |
| --- | --- | --- |
| 27 (කොටසක්) | .. 23 0 0 . | පොල්, පැඟිරි, පලතුරු ආදිය |
| 40 (කොටසක්) | .. 9 0 0 .. | එම |
| 42 (කොටසක්) | ..162 0 0 .. | එම |

F. V. P. 223. ගම—වඩුවදෙනිය.

| | | |
| --- | --- | --- |
| 33 (කොටසක්) | .. 68 0 0 .. | කුරුඳු, පුවක්, පොල් ආදිය |

F. V. P. 225. ගම—පිස්සුබැද්ද.

| | | |
| --- | --- | --- |
| 29 (කොටසක්) | .. 55 0 0 .. | පුවක්, පොල්, පැඟිරි, අඹ ආදිය |

---

අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ
ඉඩම් කච්චේරියේ දැන්වීමයි.

(මධ්‍යම පළාතේ ලාබ්කයන් සම්බන්ධයෙනි.)

මෙහි පහත විස්තර දැක්වෙන ඉඩම් සඳහාවූ ඉල්ලුම්පත්‍ර සලකාබලා ගනු පිණිසත් කොටස් වශයෙන් ඒ ඉඩම්වලට අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගැනීම පිණිසත් කටුවන තානායම් බංගලාවේදී වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 8වෙනි අඟහරුවාදා පූ. භා. 9ට 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධනකිරීමේ ආඥාපණත යටතේ ඉඩම් කච්චේරියක් හම්බන්තොට ආණ්ඩුවේ අතිරේක උප ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. මේ ඉඩම් කච්චේරි මධ්‍යම පළාතේ ලාබ්කයන්ට පමණකි.

3. සියලුම ඉල්ලුම්පත්‍ර ආණ්ඩුවේ උප ඒජන්තතුමා වෙත හම්බන්තොට කච්චේරියට වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 1වෙනි දින හෝ ඊට මත්තෙන් ලැබිය යුතුයි.

4. ඉල්ලුම්කරුවන් විසින් ඉල්ලුම්කර තිබෙන ප්‍රමාණයේ හැටියට අක්කරයට රු. 3 බැගින් වැටෙන මුදලක් සියලුම ඉල්ලුම්පත්‍රත් සමග එවිය යුතුයි. ඉල්ලුම්කරුගේ ක්‍රියාවක් හෝ ප්‍රමාදයක් නිසා වුවමනා නැති අමතර මැනීමක්කිරීමට ආණ්ඩුවට සිදුවුවහොත් මේ මුදල ආපසු දෙනු නොලැබේ. එබඳු ඒ මුදලක් ඒ ඒ විශේෂ අවස්ථාවලදී ආපසු දීම හෝ නොදීම යුක්තිසහගතදැයි යන්න ගැන ඉඩම් කොමසාරිස්තුමන් විසින් කරන තීරණය අවසාන තීරණය වන්නේය.

5. සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයෙකු එවිය යුතුයි. ඉල්ලුම්කරු, නියෝජිත යන දෙදෙනාගෙන් එක්කෙනෙකුවත් ඉඩම් කච්චේරියට නොපැමිණියොත් ඉල්ලුම්කරු තම ඉල්ලීම සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියාකිරීමට අකැමති බැව් ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් සලකනු ලැබේ.

6. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

7. සියලුම ඉඩම් ඉල්ලීම් කච්චේරියෙන් ලබාගත හැකිවූ පෝරම්පත්‍රයේ ලියාඑවිය යුතුයි.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් කොමසාරිස්තුමා.

දීමට යන ඉඩම්වල විස්තර.

F. V. P. 138. ගම—පත්තෙන්විලයාය.

| කැබැල්ල. | ප්‍රමාණය (කිට්ටු වශයෙන්), අ. රූ. ප. | මේ ඉඩම්වල වැවීමට සුදුසු ශස්‍ය වර්ග. |
| --- | --- | --- |
| 38 (කොටසක්) | .. 22 0 0 .. | පොල්, පලතුරු, පැඟිරි ආදිය |

F. V. P. 139. ගම—මීගහහේන.

| | | |
| --- | --- | --- |
| 4 (කොටසක්) | .. 60 0 0 .. | පොල්, පලතුරු, පැඟිරි ආදිය |

F. V. P. 140. ගම—ආරබොඩ.

| | | |
| --- | --- | --- |
| 9 (කොටසක්) | .. 5 0 0 .. | පොල්, පලතුරු, පැඟිරි ආදිය |
| 34 (කොටසක්) | .. 17 0 0 .. | එම |
| 9G (කොටසක්) | .. 11 0 0 .. | එම |

F. V. P. 209. ගම—හැඹිවත්ත.

| | | |
| --- | --- | --- |
| 1 | .. 47 0 0 .. | පොල්, පලතුරු, පැඟිරි ආදිය |

F. V. P. 210. ගම—හොරම්බින්න.

| | | |
| --- | --- | --- |
| 37 (කොටසක්) | .. 24 0 0 .. | පොල්, පලතුරු, පැඟිරි ආදිය |
| 32W | .. 1 0 20 .. | එම |
| 32Y | .. 0 3 7 .. | එම |
| 32AB | .. 0 1 26 .. | එම |
| 32AC | .. 0 3 39 .. | එම |
| 52 (කොටසක්) | .. 25 0 0 .. | එම |
| 44 (කොටසක්) | .. 20 0 0 .. | එම |

F. V. P. 150. ගම—කඩුවහ බින්තැන්න.

| | | |
| --- | --- | --- |
| 13 (කොටසක්) | .. 62 0 0 .. | පොල්, පලතුරු, කජු ආදිය |

---

අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ
ඉඩම් කච්චේරියේ දැන්වීමයි.

(මධ්‍යම පළාතේ ලාබ්කයන් සම්බන්ධයෙනි.)

මෙහි පහත විස්තර දැක්වෙන ඉඩම් සඳහාවූ ඉල්ලුම්පත්‍ර සලකාබලා ගනු පිණිසත් කොටස් වශයෙන් ඒ ඉඩම්වලට අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගැනීම පිණිසත් කටුවන තානායම් බංගලාවේදී වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 8වෙනි අඟහරුවාදා අ. භා. 1.30ට 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධනකිරීමේ ආඥාපණත යටතේ ඉඩම් කච්චේරියක් හම්බන්තොට ආණ්ඩුවේ අතිරේක උප ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. මේ ඉඩම්කච්චේරි මධ්‍යම පළාතේ ලාබ්කයන්ට පමණකි.

3. සියලුම ඉල්ලුම්පත්‍ර ආණ්ඩුවේ උප ඒජන්තතුමා වෙත හම්බන්තොට කච්චේරියට වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 1වෙනි දින හෝ ඊට මත්තෙන් ලැබිය යුතුයි.

4. ඉල්ලුම්කරුවන් විසින් ඉල්ලුම්කර තිබෙන ප්‍රමාණයේ හැටියට අක්කරයට රු. 3 බැගින් වැටෙන මුදලක් සියලුම ඉල්ලුම්පත්‍රත් සමග එවිය යුතුයි. ඉල්ලුම්කරුගේ ක්‍රියාවක් හෝ ප්‍රමාදයක් නිසා වුවමනා නැති අමතර මැනීමක්කිරීමට ආණ්ඩුවට සිදුවුවහොත් මේ මුදල ආපසු දෙනුනොලැබේ. එබඳු ඒ මුදලක් ඒ ඒ විශේෂ අවස්ථාවලදී ආපසු දීම හෝ නොදීම යුක්තිසහගතදැයි යන්න ගැන ඉඩම් කොමසාරිස්තුමන් විසින් කරන තීරණය අවසාන තීරණය වන්නේය.

5. සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයෙකු එවිය යුතුයි. ඉල්ලුම්කරු, නියෝජිත යන දෙදෙනාගෙන් එක්කෙනෙකුවත් ඉඩම් කච්චේරියට නොපැමිණියොත්, ඉල්ලුම්කරු තම ඉල්ලීම සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියාකිරීමට අකැමති බැව් ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් සලකනු ලැබේ.

6. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

7. සියලුම ඉඩම් ඉල්ලීම් කච්චේරියෙන් ලබාගත හැකිවූ පෝරම්පත්‍රයේ ලියාඑවිය යුතුයි.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් කොමසාරිස්තුමා.

දීමට යන ඉඩම්වල විස්තර.

F. V. P. 151. ගම—රනසිත්ගොඩ.

| කැබැල්ල. | ප්‍රමාණය (කිට්ටු වශයෙන්), අ. රූ. ප. | මේ ඉඩම්වල වැවීමට සුදුසු ශස්‍ය වගී. |
|---|---|---|
| 6R | .. 4 0 24 .. | පොල්, පලතුරු, කජු ආදිය |
| 14 (කොටසක්) | 58 0 0 .. | එම |

F. V. P. 137. ගම—කෙහෙල්වත්ත.

| | | |
|---|---|---|
| 4 (කොටසක්) | 42 0 0 .. | පොල්, පැඟිරි, පලතුරු ආදිය |
| 17 (කොටසක්) | 38 0 0 .. | එම |

F. V. P. 193. ගම—අඹුදම්න.

| | | |
|---|---|---|
| 22 (කොටසක්) | 60 0 0 .. | පොල්, පැඟිරි, පලතුරු ආදිය |
| 29 (කොටසක්) | 30 0 0 .. | එම |
| 30 (කොටසක්) | 10 0 0 .. | එම |

F. V. P. 196. ගම—සියාරපිටිය.

| | | |
|---|---|---|
| 6 (කොටසක්) | 45 0 0 .. | පොල්, පැඟිරි, කෝපි ආදිය |
| 6O (කොටසක්) | 24 0 0 . | එම |

F. V. P. 202. ගම—හල්වත්ත.

| | | |
|---|---|---|
| 7AD | .. 0 1 2 .. | පොල්, පැඟිරි, කොස් ආදිය |
| 87 (කොටසක්) | 220 0 0 .. | එම |

---

අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරීම පිළිබඳ
ඉඩම් කච්චේරියේ දැන්වීමයි.

(මධ්‍යම පළාතේ ලෑංකිකයන් සම්බන්ධයෙනි.)

මෙහි පහත විස්තර දැක්වෙන ඉඩම් සඳහාවූ ඉල්ලුම්පත්‍ර කල්පනාවට ගනු පිණිසත් කොටස් වශයෙන් ඒ ඉඩම්වලට අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගැනීම පිණිසත් කටුගස්තොට කාර්යාලයේ බංගලාවේදී වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 9වෙනි බදාදා පූ. භා. 9ට 1935 වර්ෂයේ අංක 19 දරන ඉඩම් සංවර්ධනය කිරීමේ ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් හම්බන්තොට ආණ්ඩුවේ අතිරේක උප ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. මේ ඉඩම් කච්චේරිය මධ්‍යම පළාතේ ලෑංකිකයන්ට පමණකි.

3. සියලුම ඉල්ලුම්පත්‍ර ආණ්ඩුවේ උප ඒජන්තතුමා වෙත හම්බන්තොට කච්චේරියට වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 1වෙනි දින හෝ ඊට මත්තෙන් ලැබිය යුතුයි.

4. ඉල්ලුම්කරුවන් විසින් ඉල්ලුම්කර තිබෙන ප්‍රමාණයේ හැටියට අක්කරයට රුපියල් 3 බැගින් වැටෙන මුදලක් සියලුම ඉල්ලුම්පත්‍රත් සමග එවිය යුතුයි. ඉල්ලුම්කරුගේ ක්‍රියාවක් හෝ ප්‍රමාදයක් නිසා වූවමනා නැති අම්බර මැනීමක් කිරීමට ආණ්ඩුවට සිදුවුවහොත් මේ මුදල ආපසු දෙනු නොලැබේ. එබඳු ඒ මුදලක් ඒ ඒ විශේෂ අවස්ථාවලදී ආපසු දීම හෝ නොදීම යුක්තිසහගතදැයි යන්න ගැන ඉඩම් කොමසාරිස්තුමන් විසින් කරන තීරණය අවසාන තීරණය වන්නේය.

5. සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි. ඉල්ලුම්කරු, නියෝජිත යන දෙදෙනාගෙන් එක්කෙනෙකුවත් ඉඩම් කච්චේරියට නොපැමිණියොත් ඉල්ලුම්කරු තම ඉල්ලීම සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියාකිරීමට අකැමති බැව් ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් සලකනු ලැබේ.

6. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

7. සියලුම ඉඩම් ඉල්ලීම් කච්චේරියෙන් ලබාගත හැකිවූ පෝරම්පත්‍රයේ ලියාඑවිය යුතුයි.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් කොමසාරිස්තුමා.

දීමට යන ඉඩම්වල විස්තර.

F. V. P. 205. ගම—දරදූන්යාය.

| කැබැල්ල. | ප්‍රමාණය (කිට්ටු වශයෙන්), අ. රූ. ප. | මේ ඉඩම්වල වැවීමට සුදුසු ශස්‍ය වගී. |
|---|---|---|
| 24 (කොටසක්) | ..120 0 0 .. | පොල්, පැඟිරි, කොස් ආදිය |

ප්‍රමාණය (කිට්ටු වශයෙන්), මේ ඉඩම්වල වැවීමට
කැබැල්ල. අ. රූ. ප. සුදුසු ශස්‍ය වගී.

F. V. P. 207. ගම—ජිපිගහයාය.

| | | |
|---|---|---|
| 20 (කොටසක්) | .. 52 0 0 .. | පොල්, පැඟිරි, කොස් ආදිය |
| 2AS | .. 1 0 20 .. | එම |

F. V. P. 208. ගම—මීමනකොලදෙනිය.

| | | |
|---|---|---|
| 1 (කොටසක්) | .. 65 0 0 .. | පොල්, පැඟිරි, කොස් ආදිය |

---

අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරීම පිළිබඳ
ඉඩම් කච්චේරියේ දැන්වීමයි.

(මධ්‍යම පළාතේ ලෑංකිකයන් සම්බන්ධයෙනි.)

මෙහි පහත විස්තර දැක්වෙන ඉඩම් සඳහාවූ ඉල්ලුම්පත්‍ර කල්පනාවට ගනු පිණිසත් කොටස් වශයෙන් ඒ ඉඩම්වලට අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගැනීම පිණිසත් වීරකැටියේ කාර්යාලයේ බංගලාවේදී වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 9වෙනි බදාදා අ. භා. 3.30ට 1935 වර්ෂයේ අංක 19 දරන ඉඩම් සංවර්ධනය කිරීමේ ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් හම්බන්තොට ආණ්ඩුවේ අතිරේක උප ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. මේ ඉඩම් කච්චේරිය මධ්‍යම පළාතේ ලෑංකිකයන්ට පමණකි.

3. සියලුම ඉල්ලුම්පත්‍ර ආණ්ඩුවේ උප ඒජන්තතුමා වෙත හම්බන්තොට කච්චේරියට වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 1වෙනි දින හෝ ඊට මත්තෙන් ලැබිය යුතුයි.

4. ඉල්ලුම්කරුවන් විසින් ඉල්ලුම්කර තිබෙන ප්‍රමාණයේ හැටියට අක්කරයට රු. 3 බැගින් වැටෙන මුදලක් සියලුම ඉල්ලුම්පත්‍රත් සමග එවිය යුතුයි. ඉල්ලුම්කරුගේ ක්‍රියාවක් හෝ ප්‍රමාදයක් නිසා වූවමනා නැති අම්බර මැනීමක් කිරීමට ආණ්ඩුවට සිදුවුවහොත් මේ මුදල ආපසු දෙනු නොලැබේ. එබඳු ඒ මුදලක් ඒ ඒ විශේෂ අවස්ථාවලදී ආපසු දීම හෝ නොදීම යුක්තිසහගතදැයි යන්න ගැන ඉඩම් කොමසාරිස්තුමන් විසින් කරන තීරණය අවසාන තීරණය වන්නේය.

5. සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීමට නියෝජිතයකු එවිය යුතුයි. ඉල්ලුම්කරු නියෝජිත යන දෙදෙනාගෙන් එක්කෙනෙකුවත් ඉඩම් කච්චේරියට නොපැමිණියොත් ඉල්ලුම්කරු තම ඉල්ලීම සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියාකිරීමට අකැමති බැව් ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් සලකනු ලැබේ.

6. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

7. සියලුම ඉඩම් ඉල්ලීම් කච්චේරියෙන් ලබාගත හැකිවූ පෝරම්පත්‍රයේ ලියාඑවිය යුතුයි.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් කොමසාරිස්තුමා.

දීමට යන ඉඩම්වල විස්තර.

F. V. P. 379. ගම—කඳම්ඹිත්ත

| කැබැල්ල. | ප්‍රමාණය (කිට්ටු වශයෙන්), අ. රූ. ප. | මේ ඉඩම්වල වැවීමට සුදුසු ශස්‍ය වගී. |
|---|---|---|
| 1A | .. 0 0 34 .. | පොල්, පලතුරු, අඹ ආදිය |
| 2 | .. 0 1 30 .. | එම |
| 3 | .. 0 1 28 .. | එම |
| 4 | .. 0 3 5 .. | එම |
| 17 (කොටසක්) | ..165 0 0 .. | එම |

F. V. P. 380. ගම—හල්පොත්තෙයාය.

| | | |
|---|---|---|
| 9C (කොටසක්) | .. 1 0 0 .. | පැඟිරි, කජු ආදිය |
| 9CB (කොටසක්) | .. 35 0 0 .. | එම |

F. V. P. 261. ගම—බැදිගම.

| | | |
|---|---|---|
| 10D | .. 41 2 8 .. | පොල්, කජු ආදිය |
| 10F | .. 40 0 0 .. | එම |

## මැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

L. H. 1742.

"කාක්දූවේ" බද්ද.

කැළණිගංමෝයේ පිහිටි නො. 15,805 දරණ මුල් සිතියමේ පෙනෙන Z 54 සහ A 55 දරණ අ. 19, රූ. 3, ප. 24ක් විශාල "කාක්දූව" කියන ඉඩම වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 1වෙනි දින පටන් පූර්ණ අවුරුදු පහකුත් මාස දෙකක බද්ද මෙහි පහත සඳහන් කොන්දේසිවලට යටත්ව මිලේට ගැනීම පිණිස එවනු ලබන සිල්තබනලද ඉල්ලුම්පත්‍ර බස්නාහිර පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්ට යෙදුන බව මෙයින් දන්වනු ලැබේ.

යථෝක්ත ඉල්ලුම්පත්‍ර වර්ෂ 1939ක්වූ ජූලි මස 21වෙනි දිනවූ සිකුරාදා දවල් 11 වනතුරු භාරගෙණ එදින එකී වේලාවට කඩාබලනවා ඇත. ඉල්ලුම්පත්‍ර බහාඑවන කවරවල පිට "කාක්දූවේ බද්ද ගැන ඉල්ලුම්පත්‍රය" කියා සඳහන්කළ යුතුයි. ඉල්ලුම්පත්‍ර සැබෑබව ඔප්පුකිරීම පිණිස ඉල්ලුම්කරන්නාවූ සියළුදෙනාම තුමූ තමන්ම හෝ තමන් වෙනුවට ක්‍රියාකරන්නෙක් ඒජන්ත උන්නාන්සේ ඉදිරියේ පෙනීසිටින්ට ඕනෑය.

වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් ඉල්ලුම්කොට ලබාගතහැක.

ඩබ්ලිව්. ඕ. ස්ටීවන්ස්,
බස්නාහිර පලාතේ ආණ්ඩුවේ ඒජන්ත
උන්නාන්සේ වෙනුව.

1939ක්වූ ජූනි මස 26වෙනි දින
කොළඹ කච්චේරියේදීය,

කොන්දේසි.

1. මිලේට ගත් අය විසින් අවුරුදු පහක් සහ මාස දෙකකට සම්පූර්ණ බදු මුදල විකිණීමේ දිනදී ගෙවිය යුතුය.

2. ඉඩමේ පිහිටි ගහකොළවල සහ ගොඩනැගිලි ආදියක් ඇත්නම් ඒවා භුක්තිවිඳීමට මිලේට ගත් අයට බලය තිබේ.

3. මිලේට ගත් අයට හෝ ඔහුගේ වැඩකරුවන්ට කිසිම ගහක් කපන්ටවත් වැටක්, මායිමක් හෝ ගොඩනැගිලි ආදියක් වෙනස්කරන්ටවත් අවසර නැත.

4. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් බදුගන්නාලද ඉඩමේ වැටක් බඳින්ට කියා අණකළොත් බදුගැනුම්කාරයා විසින් කළයුතුයි.

5. බදුගැනුම්කාරයා විසින් ඉඩම ශුබපවිත්‍රලෙස තබාගන්ටත්, සියලුම අයබදු ගෙවන්ටත්, නාගරික සභාවේ අණපණත් පරිදි ක්‍රියාකරන්ටත් ඕනෑය.

6. ඒජන්ත උන්නාන්සේට හෝ උන්නාන්සේගේ අණ පරිදි ක්‍රියාකරන්නෙකුට ඕනෑවිටකදී බදුකාරයාට මාසයක් කල්දී නැවත ඉඩමේ භුක්තිය භාරගැනීමට බලය තිබේ.

7. ඒජන්ත උන්නාන්සේගේ කැමැත්ත සහිත ලියවිල්ලක් නැතුව බදුකාරයා විසින් අන්කෙනෙකුට බද්ද පවරාදීම හෝ විකිණීම තහනම්ය.

8. ඉඩමේ පිහිටි පොල්ගස් මහරුවට හෝ මීරාවට මැදීමට බදුකාරයා විසින් අවකාශ දියයුතු නොවේ.

9. මී හෝ එළු කිරිදෙනුන් තණකන්ට ඇරීම හා සතුන් නිදල්ලේ සිටීමට ඉඩහැරීම තහනම්ය.

10. සම්පූර්ණ ඉඩම හෝ ඉන් කොටසක් බද්ද අවසාන වෙන්ට ප්‍රථම ආණ්ඩුවට ඕනෑකළොත් මාසයක් කල්දුන්විට ආණ්ඩුවට භාරදිය යුතුයි. බදු මුදල් ගෙවා ඉතිරිවූ බදු කාලයේ හැටියට ලැබියයුතු මුදල බදු ගැනුම්කාරයාට ආපසු ගෙවන්ට යෙදෙනවා ඇත.

11. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට හෝ ඒ වෙනුවෙන් ක්‍රියාකරන්නෙකුට ඒම කාලය ඇතුළත සුදුසු වේලාවලදී ඉඩමේ තත්වය පරීක්ෂාකර බැලීම සඳහා ඉඩමට ඇතුල්වීමට බදුකාරයා විසින් අවසරදිය යුතුයි.

12. බදු ගැනුම්කාරයා විසින් ඉඩමේ තිබෙන ලකුණු කූඤ්ඤ හෝ අගල් ආදිය වෙනස් නොකරණ හැටියට වගබලා ගතයුතුයි.

13. ඉහත් සඳහන් කොන්දේසි කඩකළොත් කිසිම මුදලක් නොගෙවා බදුගැනුම්කාරයා හෝ ඔහුගේ වැඩකරුවන් ඉඩමෙන් අස්කර නැවත භුක්තිය භාරගැනීමට ඒජන්ත උන්නාන්සේට හෝ ඒ වෙනුවෙන් ක්‍රියාකරන්නෙකුට බලය තිබේ.

14. යම්කිසි ඉල්ලුම්පත්‍රයක් හෝ සියළුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂෙපකිරීමට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

---

L. H. 1743.

නො. 15,805 දරණ මුල් සිතියමේ නො. 6486, 6487 සහ 6483 යන අංකවලින් යුත් මෝදර පිහිටි බිම්කට්ටිය සම්බන්ධවයි.

මෙහි පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන්කරණ ඉඩම එලවළු සහ තණ වැවීමට වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 1වෙනි දින පටන් පස් (5) අවුරුදු දෙමාසයක බද්ද මෙහි පහත සඳහන් කොන්දේසිවලට යටත්ව මිලේටගැනීම පිණිස එවනු ලබන සිල් තබනලද ඉල්ලුම්පත්‍ර බස්නාහිර පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්ට යෙදෙන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

යථෝක්ත ඉල්ලුම්පත්‍ර වර්ෂ 1939ක්වූ ජූලි මස 21වෙනි දිනවූ සිකුරාදා දවල් 11 වනතුරු භාරගෙණ එදින එකී වේලාවට කඩාබලනවා ඇත. ඉල්ලුම්පත්‍ර බහා එවනලද කවරවල පිට "නො. 15,805 දරණ මුල් සිතියමේ නො. 6486, 6487 සහ 6488 යන අංකවලින් යුත් මෝදර පිහිටි බිම්කට්ටියේ එලවළු සහ තණ වැවීමේ බද්ද" කියා සඳහන්කළ යුතුයි. ඉල්ලුම්පත්‍ර සැබෑබව ඔප්පුකිරීම පිණිස ඉල්ලුම්කරන්නාවූ සියළුදෙනාම තම තමන් හෝ තමන් වෙනුවට ක්‍රියාකරන්නෙක් ඒජන්ත උන්නාන්සේ ඉදිරියේ පෙනීසිටින්ට ඕනෑය.

වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් ඉල්ලුම්කොට ලබාගතහැක.

අත්සන්කළේ, ඩබ්ලිව්. ඕ. ස්ටීවන්ස්,
බස්නාහිර පලාතේ ආණ්ඩුවේ ඒජන්ත
උන්නාන්සේ.

1939ක්වූ ජූනි මස 23වෙනි දින
කොළඹ කච්චේරියේදිය.

කොන්දේසි.

1. අටමාසයකට වැටෙන බදු මුදල බද්ද මිලයටගත් දින ගෙවිය යුතුය. මේ බද්ද සම්බන්ධ වෙනත් අයකිරීමක් ආණ්ඩුවට නොමැතිනම් මේ බදු මුදල බදු කාලයේ අවසාන අටමාසයේ බදු මුදල් වශයෙන් ගණන්ගනු ලැබේ. බදු මුදල් කාර්තුවක් පාසා (තුන්මාසයකට වරක්) කාර්තුව මුලදී ගෙවිය යුතුය.

2. බද්ද ගැනුම්කාරයා එකඟවියයුතු පොරොන්දු මෙසේය:—

(a) ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලියවිල්ලකින් ලබාගත් අවසරයක් නොමැතිව තණකැවීමට හා එලවළු සහ තණ වැවීමට හැර මේ ඉඩම වෙනයම් කිසිම ප්‍රයෝජනයකට නොයොදන්වද,

(b) කිසිම අගලක්, ගහක් නොකපන්වද, මායිම් ගලක් වැටක් හෝ මායිමක් වෙනස් නොකරන්වද,

(c) ඉඩමෙන් වැලි බොරළු ආදිය නොගන්වද,

(d) ඉඩමේ වැටක් බඳින්ට කියා ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ අණකළොත් එසේ කරන්වද,

(e) ස්ථිර හෝ තාවකාලික ගොඩනැගිලිද, වෙළඳපොළ වල්ද නොකරන්වද,

(f) ඉඩම ශුබපවිත්‍රලෙස තබාගන්වත්, සියලුම අයබදු ගෙවන්වත්, නාගරික සභාවේ අණපනත් පරිදි ක්‍රියාකරන්ට නීතිවිරෝධී කටයුතු කෙරුනුවිටක පැමිණෙන හානි දඩ ආදියට වගකීමෙන් ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ නිදහස්කරන්නවද,

(g) ඒජන්ත උන්නාන්සේගේ කැමැත්ත සහිත ලියවිල්ලක් නැතුව අන්කෙනෙකුට බද්ද පැවරීම හෝ විකිණීම නොකරන්වද,

(h) කිරිදෙනුන් (එළු හෝ මී) තණකැවීමට ඉඩනොදෙන්වද,

(i) මෙය වැලැක්වීම පිණිස නාගරික සභාවේ නිලධාරීන්ගේ පරීක්ෂණයට ඉඩදෙන්වද,

(j) ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට හෝ ඒ වෙනුවෙන් ක්‍රියාකරන්නෙකුට එම කාලය ඇතුළ සුදුසු වේලාවලදී ඉඩමේ තත්වය පරීක්ෂාකර බැලීම සඳහා ඉඩමට ඇතුල්වීමට ඉඩදෙන්වද,

(k) සම්පූර්ණ ඉඩම හෝ ඉන් කොටසක් බද්ද අවසානවෙන්ට පූර්ව ආණ්ඩුවට ඕනෑකළොත් මාසයක් කල්දුන්විට ආණ්ඩුවට භාරදෙන්වද එසේවූවිට බද්දෙන් ඉදිරියට ගෙවන්ට තිබෙන කාලයට වැටෙන මුදලක් ආපසු ලබාගෙන අස්වෙන්වද,

(l) ඉහත සඳහන් කොන්දේසි කඩකළොත් කිසිම මුදලක් නොගෙවා බදු ගැනුම්කාරයා හෝ ඔහුගේ වැඩකරුවන් ඉඩමෙන් අස්කර නැවත භුක්තිය භාර ගැනීමට ඒජන්ත උන්නාන්සේට හෝ ඒ වෙනුවෙන් ක්‍රියාකරන්නෙකුට ඉඩදෙන්වද යනුයි.

3 යම්කිසි ඉල්ලුම්පත්‍රයක් හෝ සියලුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂෙපකිරීමට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

උප ලේඛනය.

නො. 15,805 දරණ මුල් සිතියමේ නො. 6486, 6487 සහ 6488 යන අංකවලින් යුත් කැළණිගංමෝය අසල ඔමඩීන් වැඩුනු නො. 15,805 දරණ මුල් සිතියමේ Z 54 සහ A 55 යන අංකවලින් යුත් කාක්කාදූව නමින් ව්‍යවහාර කොටස හැර ඉතිරි ඉඩම්.

පිහිටීම.—මෝදර.

බිම්ප්‍රමාණය.—අක්කර 17කුත් පර්චස් 5ක වැඩි අඩු ප්‍රමාණය.

ඉඩමේ විස්තර.—තණකොළ ඇති හිස් බිම.

මෙහි පහත සඳහන්වෙන පුත්තලම සහ හලාවත දිස්ත්‍රික්කු වල පාලම් සහ ඇල රේන්ද වර්ෂ 1939ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් වර්ෂ 1940ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා දොළොස් මාසයකට ආණ්ඩුවෙන් බදුගැනීමට එවනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර පුත්තලමේ උප ඒජන්ත උන්නාන්සේ විසින් භාරගනු ලැබේ.

2. පෙරකී මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර මතුපිට හෙවත් ඇන්විලොප් උඩ "Tender for Toll Rents" රේන්ද සඳහා ඉල්ලුම්පත්‍ර යන වාසගම ඇතුව වර්ෂ 1939ක්වූ ජූලි මස 17වෙනි දින දවල් 11ට පුත්තලම් කච්චේරියේදී භාරගනු ලැබේ. ඉල්ලුම්කාරයෝම පෙනීසිට ඔවුන්ගේම අතින් ඉල්ලුම්පත්‍ර භාරදෙන්ට ඕනෑය. තැපැල් මගින් එවනලද ඉල්ලුම්පත්‍ර හෝ ඔතු පෙනෙන වෙලාවට පසු එවනලද ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

3. ඒ ඒ රේන්දපලවල්වලට වෙන් වෙන් වශයෙන් ඉල්ලුම් පත්‍ර දෙන්ට ඕනෑය.

4. උප ඒජන්ත උන්නාන්සේ විසින් උතුමාණන්වහන්සේ වෙත ඔප්පුකර සිටීමට තෝරාගන්නාලද ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා විසින් ඉල්ලාපු ගණනින් දහයෙන් කොටසකට වැටෙන මුදල් ගණන සල්ලිවලින් වහාම ඇපතබන්ට ඕනෑවා පමණක්නොව එම ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් භාරගන්ට යෙදුනිනම් ඒ බව දැනුම්දෙන දින සිට 30 දවසක් ඇතුළතදී එම ඉල්ලූ ගණනින් දෙකෙන් පංගුවකට වටිනා ඇප ඒත්තුගත් මුද්‍ර ඔප්පුවලින් හෝ තුනෙන් කොටසකට වටිනා ඇප මුදලෙන් හෝ තිබා සම්පූර්ණකරන්ට ඕනෑය.

5. ඇප පිණිස තබනලද ඔප්පු සෝදිසිකිරීමට සහ ඔප්පු වල සඳහන් ඇප ඉඩම් ගැන අදහස ප්‍රකාශකිරීමටද ආණ්ඩුවේ පෙරකදෝරු උන්නාන්සේට ගෙවියයුතු ගාස්තුද, එසේම ඇප ඔප්පු ලිවීමට සහ ඒවා සම්පූර්ණකිරීමටද, වර්ෂ 1919යේ නො. 10යේ රෙකුලාසිය යටතේ ගෙවියයුතු ඔප්පුවලට මුද්දර ගාස්තුද යන සියල්ලම ගෙවීම පිණිස මුදල් බදින්ට ඕනෑය.

6. ඇප වෙනුවෙන් තබනලද ඉඩම්වල ඔප්පු, ඒවා මීට ප්‍රථම ඇපේකට නොහොත් උකසකට යටත් නැති බවට ඉඩම් ලියාපදිංචිකරණ රිජිස්ත්‍රාර්තුමාගෙන් සහතිකපත්‍රයක් ලබා ගත යුතුයි. මේ සහතිකපත්‍ර ලබාගැනීමට ඕනෑකරන වියදම් ඇපතබන අය විසින්ම දැරිය යුතුයි.

7. කිසිම නොහොත් සියලුම ඉල්ලුම්පත්‍ර ප්‍රශන නොකර එපාකිරීමට බලයක් උප ඒජන්ත උන්නාන්සේට තබාගනු ලැබේ.

වැඩිදුර කාරණා පුත්තලමේ උප ඒජන්ත උන්නාන්සේ ගෙන් ඉල්ලුම්කළවිට දැනගත හැක.

ඇල රේන්ද.

1. වූනකිපිරවූ.

තොටුපල් රේන්ද.

1. පුත්තලම්-ඒකාලේ.
2. පුත්තලම-කල්පිටිය.
3. කල්පිටිය-කරතිව්.

ආර්. මොහිතෙපනී,
පුත්තලම්-හලාවත දිස්ත්‍රික්කවල
උප ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1939ක්වූ ජූනි මස 27වෙනි දින
පුත්තලම් කච්චේරියේදීය.

---

## දිස්ත්‍රික් රෝඩ් කොමිටි පිළිබඳ දැන්වීම.

1938, 1939 සහ 1940වත් තුමන්කඩුව දිස්ත්‍රික් රෝඩ් කොමිටියේ සාමාජිකකමට තෝරගත් ජී. ඒ. ඒ. ගුනවර්ධන මහතාගේ ඉල්ලා අස්වීමේ පුරප්පාඩුව සම්පූර්ණකරගැනීමට වර්ෂ 1939යේ ඉතිරි කාලයට සහ 1940වත් සාමාජිකයෙක් හැටියට තෝරගැනීමට ඉල්ලුම්කාරසින් හැටියට ඉදිරියට එන්ට කැමති අයින් සිටීනම් එසේ තෝරගැනීමේ දිනයට අඩුගනනෙත් දවස් "දහයකට" 10යකට ඉස්සෙතෙන් එසේ බැඳෙන්ට අදහස්කරණ අය අනුරාධපුරේ ප්‍රොවින්ෂියල් රෝඩ් කොමිටියේ ප්‍රධානතැන වෙත ලියවිල්වලින් දැනුම්දියයුතු බව ලංකාණ්ඩුවේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි නො. 148වෙනි පරිච්ඡේදයෙහි 23වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙන්ට යෙදුනා ඇත.

ඉහතකී පරිච්ඡේදයෙහි 32වෙනි වගන්තිය යටතේ 1939ක්වූ ජූලි මස 21වෙනි දින පෙරවරු 10ට පොළොන්නරුවේ ගම්සභා උසාවි ශාලාවෙහිදී තුමන්කඩු දිස්ත්‍රික් රෝඩ් කොමිටියට සාමාජිකයෙක් තෝරගනු ලැබේ.

ඒ. ජී. ක්‍රිස්ටෝෆල්ස්,
උතුරුමැද පලාතේ ප්‍රොවින්ෂියල්
රෝඩ් කොමිටියේ ප්‍රධානතුමා.

වර්ෂ 1939ක්වූ ජූනි මස 24වෙනි දින අනුරාධපුරේ
ප්‍රොවින්ෂියල් රෝඩ් කොමිටියේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.